# සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය
# දැන්වීමයි

**<u>සංගීත පීඨ, දෘශ්‍ය කලා සහ නර්තන හා නාට්‍ය කලා පීඨ ශිෂ්‍ය සංගම්</u>**
**<u>සඳහා නියෝජිතයන් තෝරාපත්කර ගැනීම</u>**
**<u>2018/2019 අධ්‍යයන වර්ෂය (ඉකුත් නොවූ කාලය සඳහා)</u>**

1985 අංක 07 සහ 1988 අංක 26 දරණ පනත්වලින් සංශෝධිත පරිදි 1978 අංක 16 දරණ විශ්වවිද්‍යාල පනතෙහි 135 වන ජේදය හා 112 (3) ජේදය යටතේ සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලයෙහි පාලක සභාව විසින් පනවන ලද අතුරු ව්‍යවස්ථාවෙහි 6(1) ජේදය ප්‍රකාර පීඨ ශිෂ්‍ය සංගම් පිහිටුවීම සඳහා පහත සඳහන් නිවේදනය කරනු ලැබේ.

(අ) පීඨ ශිෂ්‍ය සංගමයේ නම

1. සංගීත පීඨ ශිෂ්‍ය සංගමය
2. දෘශ්‍ය කලා පීඨ ශිෂ්‍ය සංගමය
3. නර්තන හා නාට්‍ය කලා පීඨ ශිෂ්‍ය සංගමය

(ආ) පීඨ ශිෂ්‍ය සංගමයට තෝරාගතයුතු නිල නාම සහ අනෙකුත් සාමාජිකයන්ගේ සංඛ්‍යාව

| සංගීත පීඨ ශිෂ්‍ය සංගමය | දෘශ්‍ය කලා පීඨ ශිෂ්‍ය සංගමය | නර්තන හා නාට්‍ය කලා පීඨ ශිෂ්‍ය සංගමය |
|---|---|---|
| සභාපති | සභාපති | සභාපති |
| උප සභාපති | උප සභාපති | උප සභාපති |
| ලේකම් | ලේකම් | ලේකම් |
| සංස්කාරක | සංස්කාරක | සංස්කාරක |
| කණිෂ්ඨ භාණ්ඩාගාරික | කණිෂ්ඨ භාණ්ඩාගාරික | කණිෂ්ඨ භාණ්ඩාගාරික |
| වෙනත් සාමාජිකයින් 08 දෙනෙකු | වෙනත් සාමාජිකයින් 04 දෙනෙකු | වෙනත් සාමාජිකයින් 08 දෙනෙකු |

(ඇ) එක් එක් පීඨ අනුව නිලවරණයට ඉදිරිපත් වීමට හා ජන්දය පාවිච්චි කිරීමට සුදුසුකම් ලබන 2018/2019 අධ්‍යයන වර්ෂය සඳහා ලියාපදිංචි වී ඇති සිසුන්ගේ නාමලේඛන මේ සමග ප්‍රදර්ශනය කරනු ලබන අතර ජන්ද හිමි නාම ලේඛනය 2005 අංක 01 දරණ ශිෂ්‍ය සංගම් අතුරු ව්‍යවස්ථාවෙහි 5(අ),(ආ),(ඉ) අනුව සකස් කර ඇත. එම ජේදයන් පහත පරිදි වේ

**5 (අ) නිලවරණය පවත්වනු ලබන අධ්‍යයන වර්ෂය සඳහා එම පීඨයේ පූර්ණ කාලීන ශිෂ්‍යයෙකු වශයෙන් විධිමත් පරිදි ලියාපදිංචි වී නොමැති නම්,**

(ආ) පීඨයෙන් සහ/හෝ විශ්වවිද්‍යාලයෙන් ඔහු වෙත තහනම් නියෝගයක් නිකුත් කර ඇත්නම්,

(ඉ) එම ඡන්දය දෙන අවස්ථාවේදී හෝ නිලවරණයට පෙනී සිටින අවස්ථාවේ හෝ ඔහු විශ්වවිද්‍යාලයට යම් මුදලක් ගෙවීමට ඇත්නම් හා එම මුදල් ආපසු ගෙවීමට විශ්වවිද්‍යාලය සමග ගිවිසුමකට එළඹී නොමැති නම්

**එබඳු කිසිම ශිෂ්‍යයෙක් නිලවරණයකදී ඡන්දය දීමට හෝ ඡන්දය සඳහා ඉදිරිපත් වීමට සුදුසුකම් නොලබන්නේය.**

රටේ පවත්නා කොවිඩ් වසංගත තත්වය හේතුවෙන් මෙම නිලවරණය මාර්ගගත ක්‍රමය ඔස්සේ සිදුකිරීමට තීරණය කර ඇත.
ඒ අනුව,

1985 අංක 07 සහ 1988 අංක 26 දරණ පනත්වලින් සංශෝධිත පරිදි 1978 අංක 16 දරණ විශ්වවිද්‍යාල පනතෙහි 135 වන ඡේදය හා 112 (3) ඡේදය යටතේ සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලයෙහි පාලක සභාව විසින් පනවන ලද අතුරු ව්‍යවස්ථාවෙහි 8(1) ඡේදය ප්‍රකාරව දී ඇති නියමයන් පහත දැක්වේ.

1. **පීඨ ශිෂ්‍ය සංගමය සඳහා නාමයෝජනා පත්‍ර භාර ගන්නා දින සහ වේලාවන්** } 2021.10.06 වන දින පෙ.ව. 8.00 සිට 2021.10.08 වන දින ප.ව. 4.00 දක්වා

2. නාමයෝජනා පත්‍ර එවිය යුතු විද්‍යුත් ලිපිනය පහත සඳහන් වේ.
   - සංගීත පීඨය – music@vpa.ac.lk
   - නර්තන හා නාට්‍ය කලා පීඨය – dean_dd@vpa.ac.lk
   - දෘශ්‍ය කලා පීඨය – deanfva@gmail.com

නාමයෝජනා පිළිබඳ විරෝධතා ඇතොත් 2021.10.09 දින පෙ.ව. 8.00 සිට මධ්‍යහන 12.00 දක්වා ඉහත සඳහන් පීඨයේ විද්‍යුත් ලිපිනය වෙත ඉදිරිපත් කළ හැක

22.09.2021
ලේඛකාධිකාරී,
සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය,
කොළඹ 07.
22.09.2021